**ශීර්ෂය 161- තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

----------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 161 - තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 16 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

--------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 117.63 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 103.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 14.33ක් හෙවත් සියයට12.18 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 100.70 | 91.15 | 9.55 | 9.48 |
| මුලධන | 16.93 | 12.15 | 4.78 | 28.23 |
| එකතුව | 117.63 | 103.30 | 14.33 | 12.18 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1.89 | 1.37 | 0.45 | 2.10 | 25.00 | 12.88 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/418/0015/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 11 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 03ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 29.04 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0104/000 | 28.87 |
| 6000/0000/00/0016/0097/000 | 0.13 |
| 6000/0000/00/0018/0100/000 | 0.04 |
| එකතුව | **29.04** |

## 2.5 විගණන නිරීක්ෂණය

-----------------------

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (iii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (v) | උප පත්‍රිකා පොත් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (vi) | මෝටර් වාහන ලැයිස්තුව | මුදල් රෙගුලාසි 1647 (ඉ) | පවත්වා නොතිබුණි. |
| (vii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (viii) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විසර්ජන ගිණුම

------------------

### 3.2.1 අයවැය විචලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03ක් සඳහා සලසා තිබුණු එකතුව රු.847,305ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය නොකිරීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 17ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11ක සිට සියයට 98ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම්

--------------

අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ උප අග්‍රිම ශේෂය රු.29,000 ක් වී තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

----------------------

2015 දෙසැම්බර් 31 දින වන විට පැවති රු.මිලියන 29ක් වූ ඉකුත් තැන්පතු පිළිබඳව මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව ලැයිස්තුවක් හා කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

විෂය අංක 16101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විෂය අංක 16101දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,091,833 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 06 ක සිට මාස12ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) සීසී 10 සාමාජික ණය ලේඛනයේ ඇතුළත් වූ රු.125,965 ක් වූ ණය ශේෂයක් කේවල ශේෂ වර්ගීකරණයේ ඇතුළත් කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| (i) | කාර්යාල උපකරණ | 62 | හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන නොතිබුණි. |
| (ii) | පරිගණක හා උපාංග | 103 | හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන නොතිබුණි. |

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව, ඒකක ගණන හෝ ප්‍රමාණය |
|---|---|---|---|
| (i) | මෝටර් වාහන | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 05 |
| | | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 06 |
| | | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 04 |
| | | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 01 |
| | | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 01 |
| | | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 03 |
| | | ව්‍යවස්ථා කටයුතු අමාත්‍යාංශය | 02 |
| | | වනජීවී දෙපාර්තමේන්තුව | 01 |
| | | පරිසර අමාත්‍යාංශය | 01 |
| (ii) | කාර්යාල උපකරණ | මාර්ග සංවර්ධන අධිකාරිය | 01 |

(iii) පරිගණක හා මාර්ග සංවර්ධන අධිකාරිය උපාංග 02

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතන සතු වාහන 13 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පරිහරණය කරමින් තිබූ අතර ඒ වෙනුවෙන් රු. 415,807 ක් වැය කර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවත එන බැරකම් රු. 466,343 ක් විය.

(ii) අමාත්‍යාංශය විසින් වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.120,349 ක්වූ බැරකම්වලට එළඹ තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2015 ජනවාරි මාසයේ සිදුවූ අනතුරක් සම්බන්ධයෙන් 2016 ජුනි 13 දින වන විටත් මූලික පරීක්ෂණ පවත්වා එම වාර්තාව හෝ අවසාන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1642 | අමාත්‍යාංශය අදාළ වාහන අනතුරු සම්බන්ධයෙන් පොලිස් වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.8 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ කාර්යාල පිරිසිදු කිරීමේ සේවය ලබා ගැනීම සඳහා 2015 වර්ෂය තුළ රු.228,658 ක් වැයකර තිබුණද, අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධව අදාළ සමාගම සමග ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) ගිවිසුම් ගත බැඳීමකින් තොරව අමාත්‍යාංශයේ කාර්යාල සෙත්සිරිපාය පරිපාලන සංකීර්ණයේ 9 වන මහලේ පවත්වාගෙන යාම සඳහා 2015 වර්ෂයේ මාස 2ක් සඳහා කුලිය ලෙස රු.7,934,032 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 13 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 46 | 33 | 13 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 24 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | **එකතුව** | **97** | **75** | **22** |